# යෙදවුම් සහනාධාර සමග මතුවන ගැටළු

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි පියදස සේනානායක විසිනි

ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂිත කිරීමට මෙරට බලයට පත්වූ සෑම රජයක්ම වෙර දැරූ බව රහසක් නොවේ. අප නිදහස ලැබීමට පෙර තිබූ රජයන් පවා මේ සඳහා උත්සාහ දැරූ අතර, ගෙවුම් ශේෂ දුෂ්කරතාවයන්ට අප මුහුණ පෑමට පටන් ගත් 1950 අග භාගයේ සිට මෙම උත්සාහයන් පැහැදිලිවම දක්නට තිබේ. අළුත් වගා බිම් ඇති කිරීමට විශාල වියදම් දැරිය යුතු හෙයින් තිබෙන වගා බිම් වලින් ලබන අස්වැන්න වැඩි කිරීමට සෑම ප්‍රයත්නයක්ම දරන ලදී. මෙහිලා වැඩි අස්වනු වී වර්ග, සරිලන තරමින් පොර, වල් හා කෘමි මර්ධනය මෙන්ම නව වගා පිළිවෙත් භාවිතයට ද ගොවි මහතුන්ට හැඩ ගැසීමට විය. ගොවීන් දිරිගැන්වීම පිණිස රජය මගින් සහතික මිළක් යටතේ වී මිලට ගැනීම මෙන්ම රාජ්‍ය ආයතන මගින් ණය සැපයීම හා එම ණය යටතේ යෙදවුම් සැපයීම, පොර සහනාධාර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් බිත්තර වී හා බීජ සැපයීම, වගා රක්ෂණය හා යෙදවුම් ගොවි මහතුන් අතර බෙදා හරින ආයතනික රටාවන් සැකසීම වැනි සහනාධාර සේවා රැසක් ද සලසා ඇත.

එහෙත් නව වගා රටාවන් සඳහා සෑහෙන වියදමක් දැරිය යුතු ය. මෙය සුළු ගොවි මහතුන්ට දැරීම අපහසු දෙයක් වූ හෙයින් ඔවුන්ගේ මුදල් දුෂ්කරතා මඟහැරවීමට රාජ්‍ය ආයතනික ණය ලබා දීමට ද රජය පියවර ගන්නා ලදී. පෞද්ගලික මාර්ගීක ණය සඳහා අධික පොලී මුදලක් ගැනීම හා ග්‍රාමීය ණය ගැති බව මීට මූලික වූ සාධක විය. එහෙත් මුදල්, පොර, බිත්තර වී, වැනි යෙදවුම් සහනාධාර ක්‍රම ඒවා සකස් කිරීමේ දී අවධානයට ලක් වූ සුළු ගොවීන්ටම ලැබේද යන්න ඒවා සකස් කළ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ මෙන් ම දේශපාලකයන් ගේ ද දැන් විමසුමට ලක්ව ඇත.

ගොවි මහතුනට වගා ණය දීම මහජන බැංකුව, සමූපකාර ග්‍රාමීය බැංකු, ලංකා බැංකුව, හා සුළු වශයෙන් හැටන් නැෂනල් බැංකුව මගින් දැන් කරනු ලැබේ. නොගෙවා හරින වගා ණය වෙනුවෙන් මහ බැංකුව මගින් 75% ආපසු ගෙවුම් සහතික දෙනු ලැබේ. අළුත් ණයක් දීමට පෙර පැරණි ණය ගෙවීම පිළිබඳ සෙවීම සාමාන්‍ය බැංකු චාරිත්‍රය වුව ද, වරින් වර බලයට පත් වූ රජයන් හැම එකක්ම නොගෙවූ ණය අත්හැර දැමීම සාමාන්‍ය සම්මතයක්ව තිබේ. බැංකු නීති යටතේ පැරණි ණය නොගෙවීම නිසා අළුත් ණය ලබා ගත හැකි ගොවීන් වසරින් වසර අඩුවීමත්, මේ නිසා ඔවුන් යළිත් සුපුරුදු පොලීකරුවන් වෙත යෑම වැළැක්වීමත් අරමුණ කර ගෙන මෙසේ ණය නොගෙවීම රජය මගින් අත්හරින ලදී. එහෙත් මෙම පිළිවෙතට වෙනත් අරුතක් ජනතාව දී ඇති බැව් දැකිය හැක. පවතින රජය ණය නොගෙවීම අත්නොහැරියත් මිළඟට එන රජය එසේ කරනු ඇතැයි සිතා ණය නොගෙවා හැරීම සිරිතක්ව

## මහජන බැංකුවේ වගා ණය

| අවුරුද්ද | දුන් ප්‍රමාණය | සම්පූර්ණ ආපසු ගෙවීම් | ලැබීමට ඇති මුදල් | ගෙවා නැති මුදල් | ආපසු ගෙවීම්වල ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 67/68 | 72,712 | 62,633 | 10,026 | 10,026 | 86·0 |
| 68/69 | 55,669 | 36,598 | 18,707 | 19,071 | 65·7 |
| 69/70 | 51,705 | 29 222 | 22,392 | 33,483 | 56·3 |
| 70/78 | 29,273 | 18,014 | 11,259 | 11,259 | 61·8 |
| 71/72 | 30,623 | 20,585 | 10,017 | 10,038 | 67·2 |
| 72/73 | 28,265 | 18,563 | 9,702 | 9,702 | 65·3 |
| 73/74 | 1,09,049 | 57,570 | 51,479 | 51,479 | 52·8 |
| 74/75 | 77,063 | 35,208 | 41,857 | 41,855 | 45·7 |
| 75/76 | 56,367 | 28,802 | 27,529 | 27,565 | 51·1 |
| 76/77 | 73,151 | 20,928 | 46,461 | 52,223 | 28 6 |
| 77/78 මහ | 21,586 | — | — | 2,21,555 | — |
| එකතුව | 8,05,463 | 3,28,154 | 2,49,425 | 4,77,309 | 40·7 |

ආර්ථික විමසුම 1978 ජනවාරි (රු: '000 වලින්)

ඇත. මේ නිසා ගත් ණය නොගෙවා එය අත් හැර දැමූ පසු අළුත් වගා ණය ඉල්ලුම් කිරීම සම්ප්‍රදයක් වී ඇත.

සුළු ගොවීන්ට ණය පහසුකම් සැලසීමට ඉදිරි පත් වූ මුල් ම වාණිජ බැංකුව වන මහජන බැංකුවේ වගා ණය පිළිබඳ පළවන වගුව මේ පිළිබඳ ජාතික ස්වරූපය මැනවින් දක්වන්නකි. ඉතා දුෂ්කර මුදල් තත්වයන් මැද වුව ද, ආයතනික වගා ණය කෙසේ හෝ සැපයීමට බලයට පත් හැම රජයක්ම කටයුතු කර ඇති බව මෙම වගුව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වනු ඇත. එමෙන් ම ශ්‍රී ලංකා ගොවීන් ආත්මාර්ථකාමී ජන කොටසක් යන හැඟමක් ද කෙනෙකුට ඇති විය හැක. එහෙත් ගම් මට්ටමින් කටයුතු සිදු වන අයුරු මැනවින් දන්නා අය දරනුයේ වෙනත් මතයකි.

## වැඩි වාසිය

ආයතනික ණය ලබා ගැනීමෙලා වැඩි පහසුකම් ඇත්තේ විශාල කුඹුරු හිමියන්ට බව පැහැදිලිව ඇත. ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් කරන ලද අධ්‍යයනයන්හි දී ද මෙය ඔප්පු වී තිබේ. ගම්බද ආර්ථික, සමාජ, සංස්කෘතික හා දේශපාලන ක්ෂේත්‍රයන් තුළ ලොකු ඉඩම් හිමියන් දරණ බලගතු බලපෑම් ආයතනික ණය ලබා ගැනීමේ දී වඩා වාසිදයක තත්වයන් ඔවුනට ලබා දී ඇත. ආයතනික ණය දීමෙලා මූලික වන සමූපකාර හා ග්‍රාමීය ආයතනවල වැදගත් තනතුරු ඔවුන් විසින් ම දැරීම මෙන් ම කුල, නෑදෑකම්, ධනය, මෙන්ම දේශපාලන සබඳතා ද ලොකු ඉඩම් හිමියන් ගේ වාසියට හේතු වී ඇත. අළුත් වගා පිළිවෙත් භාවිතයේ දී විය හැකි ආර්ථිකමය අවාසි තත්වයන් විඳ දැරීමේ ශක්තියක් තමන් වෙත තිබීම ද ලොකු ඉඩම් හිමියන් ගේම වාසියට හේතු වේ. මෙසේ ගන්නා වගා ණය ගොවි තැනට ම යෙද විය හැකි මෙවන් පිරිසම ආයතනික ණය නොගෙවීම පිළිබඳව තවදුරටත් කරුණු අධ්‍යයනය කළ යුතුව ඇත. රජය මගින් ණය නොගෙවීම් අත්හැර දැමීම මොවුන් ගේ මෙම ක්‍රියාදමයට මූලික හේතුවක් ලෙස පිළිගැනේ.

අද ගොවීන් මෙන් ම සුළු ඉඩම් හිමියන් ආයතනික ණයට වඩා ගම්බද පෞද්ගලික මාර්ගවලින් ණය ලබා ගන්නා බව පැහැදිලිව ඇත. ඔවුන් ලැබූ ආයතනික ණය ආපසු

**'ගෙවුම් සහනාධාර වල අපේක්ෂිත ප්‍රතිඵල ඒවා සකස් කිරීමේදී අවධානයට ලක්වූ සුළු ගොවීන්ටම ලැබේද යන්න දැන් විමසුමට ලක්ව ඇත.'**

නොගෙවීමට බලපාන මූලික කරුණු කිහිපයක්ද මේ පිළිබඳව කළ කරුණු හැදෑරීම් වල දී හෙළිව තිබේ.

අ. ඉඩම් කුලිය ලෙසින් අස්වැන්නෙන් සැහෙන කොටසක් ගෙවීමට වීම නිසා ණය ගෙවීමේ හැකියාව අඩුවීම.

ආ. තමන්ට වඩාත් පිහිට වන පෞද්ගලික ණය කරුවන්ට ඉක්මණින් ම ණය ගෙවීමට සිදු වීම – මේ සඳහා දැඩි පොලියක් ගෙවීමට සිදුවීම ගොවීන් පෞද්ගලික ණය ඉක්මණින් ගෙවීමට පොළඹවන හේතුවකි. ණය නොගෙව්වද අඩු තරමේ පොලියවත් ගෙවීමට සිදු වේ.

මේ හැර සුළු ඉඩම් හිමියන් ගේ වගා ආදයම් හා වියදම් මෙන් ම ඊළඟ කන්නය දක්වා යැපුම් වියදම් සළකන විට ණය ආපසු ගෙවීමට තරම් හැකියාවක් නොමැති බැව් ඇවත් මතයකි. බොහෝවිට වගා ණය ද ඔවුනගේ එදිනෙද ජීවන අවශ්‍යතාවයන් සඳහා යොදවා ගනු ලැබේ. අතිරේක බෝග සඳහා ස්ථිර මිළ මට්ටම් නොපැවතීම තවත් හේතුවකි.

## ආම්පන්න

ගොවි ආම්පන්න සඳහා බැංකු මගින් සපයන ණය ද ලොකු හා සුළු ගොවි ආදයම් පරතරය තවත් උග්‍ර කිරීමට හේතු වී ඇතැයි ද සැලකේ. ට්‍රැක්ටර්. වතුර පොම්ප, ඉසින යන්ත්‍ර මෙහිලා නිදසුන් ය, රුපියල් ලක්ෂයක් වටිනා රෝද හතරේ ට්‍රැක්ටරයක් ගැනීමට බැංකු මගින් 75% ක ණය සැපයේ. මේ සඳහා ද පිළිගත හැකි ඇපයක් අවශ්‍ය ය. මෙවැනි හැකියාවන් මෙන් ම ඉතිරි මුදල් ප්‍රමාණය සුළු ගොවීන් වෙත නොමැති වීම තවත් ප්‍රශ්නයක්ව ඇත.

පෝර සහනාධාර – දිවයිනේ බොහෝ පළාත් වල ගොවීන් තම කුඹුරුවලට මොනයම් හෝ පෝරක් යොදන බව පෝර භාවිතය පිළිබඳ

අධ්‍යයනවල දී හෙළිව ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ප්‍රමාණයන්ට අඩු වුව ද. මෙය මෙරට වී ගොවිතැනට අදළ වැදගත් දියුණුවක් ලෙස සැලකේ. 1950-51 මහ කන්නයේ සිට රජය මගින් අරඹන ලද පෝර සහනාධාරය මීට මහත් රුකුලක් වූවාට සැක නැත. සමුපකාර සාමාජිකයන්ට හා වගා කමිටු මගින් අත්පිට මුදලට ලබා ගන්නා අයට 50% සහනාධාරයක් හා ණයට ගන්නා සමුපකාර සාමාජිකයන්ට හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ගන්නා අයට 331/2% සහනාධාරයක් ලෙස මෙම ක්‍රමය 1962-63 දක්වා ක්‍රියාත්මක විය. ඉන්පසු සියළුම වී ගොවිතැන් කරන්නවුන්ට 30% සහනාධාරයක් ලෙස මෙය වෙනස් කරන ලදී. 331/3% සහනාධාරය එලෙසම පැවතුණි. තෙල් මිල ඉහළ නැංවීමේ හේතුවෙන් 1974 දී පෝර සහනාධාරය ඉවත් කරන ලදී. 1975 යළි ක්‍රියාත්මකව 1977 නොවැම්බර් මස සහනාධාරය 75% දක්වා වැඩි කරන ලදී. 1978 දී එය 50% දක්වා අඩු විය. පෝර සහනාධාරයේ සුභසාධන තත්වය පිළිබඳ වැදගත් සමාජමය ප්‍රශ්න කිහිපයක් දුන් පැන නැඟී ඇත. අත්පිට මුදලට පෝර ගත හැකි අත මිට ඇති ගොවීන්ට වැඩි සහනාධාරයකුත් ණය ක්‍රම යටතේ පෝර ගන්නා අත මිට නැති ගොවීන්ට අඩු සහනාධාරයත් ලැබීමත් මෙහිලා දක්විය හැක.

## අල්ප ප්‍රතිඵල

පෝර වැඩි හරියක් බෙදනුයේ ආයතනික ණය රටාව තුළ හෙයින් වී අස්වනු වැඩිවීමෙහිලා මෙම ක්‍රමය කොතෙක් දුරට උපකාරි වී ඇත්ද යන්න බැලීමත් වැදගත්ව තිබේ. වැඩි අස්වනු වලට තවත් සාධක කිහිපයක්ම බලපාන බව ද සත්‍යයකි. එහෙත් හොඳ කාල ගුණයන් පැවති, 1964, 1969/70 හා 1976 දී පෝර භාවිතය මෙන් ම අස්වනු ද වැඩි වී තිබේ. විවිධ ඉඩම් භුක්ති ක්‍රමවලට අනුකූලව පෝර භාවිතය වෙනස් වන බවට ද විශ්වාසයක් පවතී. මුළු දිවයිනම ගත් කළ පෝර භාවිතය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට අඩුවන බව පැහැදිලි සත්‍යයකි. මේ තත්වය විමර්ශනය කළ එක් පර්යේෂකයෙක් පවසා ඇත්තේ, 'පෝර භාවිතය සඳහා ඇති ආයතනික ණය පහසුකම් ප්‍රයෝජනයට ගැනෙනුයේ ඉතා අල්ප වශයෙන් බව යි.'

**බිත්තර වී සහ සහතික බීජ:** වී ගොවිතැනට අවශ්‍ය අත්තිකාරම් බිත්තර වී නිෂ්පාදනය තනිකරම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයක්ව ඇත. රජයේ ගොවිපලවල වගා කොට වැඩි කර ගන්නා අත්තිකාරම් බීජ ලියා පදිංචි පුද්ගලික බිත්තර වී ගොවිමහතුන් ලවා ද වගා කොට බිත්තර වී ලෙසින් මිලට ගෙන ගොවි මහතුන් අතර බෙද හරිනු ලැබේ. දෙපාර්තමේන්තුව මගින් මෙසේ වසර තුන හතරකට වරක් නව අත්තිකාරම් බීජ බෙද හරිනු ලබයි. දිවයිනේ ගොවිමහතුන් ගේ සියළු ම බිත්තර වී අවශ්‍යතාවයන් සැපයීමේ වගකීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කරට ගෙන නොමැත. තමන්ට අවශ්‍ය බිත්තර වී ගොවි මහතුන් විසින් ම සපයා ගත යුතුව ඇත.

## අසාධාරණ කම්

දිවයිනේ සියළු ම විවිධ කෘෂි දේශගුණික තත්වයන්ට සරිලන නව වී වර්ග කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ නිපදවන ගොවිපල මගින් නිපදවා ඇත. මේ අතින් බතලගොඩ ප්‍රධාන බීජ අභිජනන මධ්‍යස්ථානය හා සෙසු මධ්‍යස්ථාන සාර්ථක සේවාවක් ඉටු කර ඇත. මෙම නව වී වර්ගවල අත්තිකාරම් බීජ ද පෙර සඳහන් ක්‍රමය මගින් ගොවි මහතුන් වෙත බෙද හරිනු ලැබේ.

අත්තිකාරම් බීජ හා බිත්තර වී බෙද හැරීමේ දී මෙන් ම මිලට ගැනීමේ දී තමන්ට අසාධාරණකම් වන බව සුළු ගොවි මහතුන් ගේ ප්‍රධාන දුක්ගැනවිල්ලකි. බිත්තර වී ගොවි මහතුන් තෝරා ගැනීම හුදෙක් ව්‍යාප්ති සේවක නිලධාරීන් ගේ අභිමතය පරිදි සිදු වන්නෙකි. නව වගා පිළිවෙත් සාර්ථකව භාවිතා කිරීමේ දක්ෂතාවය මෙහිලා සුදුසුකම විය යුතුව ඇතත් ධනය, සමාජ තත්වය, දේශපාලනය වැනි සමාජ සබඳතා මෙහි දී මූලික වන කරුණු බව පැවසේ. බොහෝ විට මෙවැනි සුදුසුකම් ඇති බලගතු ලොකු ඉඩම් හිමියන් ගේ බාල වී අනර්ඝ බිත්තර වී ලෙස මිලට ගන්නා බව ඔවුහු පැහැදිලිවම පවසති. බිත්තර වී බුසලක් සඳහා වැඩිපුර සහතික මිලක් ගෙවීම මීට මූලික හේතුවක්ව ඇත. මෙලෙසින් ම දෙපාර්තමේන්තුව මගින් බිත්තර වී බෙද හරින විට ද ව්‍යාප්ති නිලධාරීන් ගේ අභිමතය වැඩිමනත්ම යොමු වන්නේ ගමේ බලගැත්තන් වෙතට බව ද ඔවුහු පවසති.